# පස්ගොඩ ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ 2014 වර්ෂය සඳහා ලැබී ඇති රු.4,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ 2014 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවල වැයකර ඇති අළුත්වැඩියා හා නඩත්තු වියදම් වූ රු.2,414,084 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදමට හර කර නොතිබුණි.

(ඇ) පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග කර ඇති පරිගණක හා උපාංග වල වටිනාකම තක්සේරු කර ජංගම නොවන වත්කම් යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවේ 2014 වර්ෂයේ සහික දීමනා, ප්‍රතිපූර්ණය කිරීමේදී දකුණු පළාත් පාලන කොමසාරිස් විසින් යතුරු පැදි සඳහා අයකර ගෙන ඇති රු.491,200 ක් වූ වාරික මුදල් සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් ආධාර යටතේ මෙන්ම වැටුප් හා දීමනා වැය යටතේද දක්වා නොතිබුණි.

(ඉ) සතිපොල සංවර්ධනය සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලේ 2013 දෙසැම්බර් මාසයට අදාල රු.11,475 ක පොලී මුදල් සමාලෝචිත වර්ෂයේ 5 වැඩ සටහනෙහි පොලි ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් වියදමට හර කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 04 අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.22,977,490 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.22,785,808 ක් වූයෙන් වෙනස රු 191,682 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.3,000,000 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,448,016 ක් විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ට වැඩි නිරවුල් නොකළ තැන්පතු ශේෂවල එකතුව රු.609,307 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
-------------------------------------
මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.25,306,463 ක් වටිනා ගිණුම් විෂයයන් 06 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, උප ලේඛන, උපයෝගී ලේඛන යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,337,604 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,392,426 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය
--------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා අක්කර බදු | 978 | 1,217 | 317 |
| කුලී | 5,411 | 6,273 | 826 |
| බලපත්‍ර ගාස්තු | 245 | 281 | - |
| වෙනත් ආදායම් | 475,144 | 42,175 | 25,182 |

2.2.2 අක්කර බදු

2014 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු වටිනාකම රු.187,212 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් රු.20,033 ක් විය. වර්ෂයට අදාල බිල් කිරීම් වලින් රු.17,033 ක් වර්ෂය තුල ලැබී තිබුණ අතර ඉකුත් වර්ෂවලට අදාල හිඟ ශේෂයෙන් වර්ෂය තුල ලැබී තිබුණු මුදල රු.9,380 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂවලට අදාල හිඟ අක්කර බදු අයවීමේ ප්‍රගතිය සියයට 5 ක් තරම් සුළු අගයක් විය. තවද සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුදල වන රු.180,831 න් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.3,000 ට වැඩි හිඟ ශේෂවල වටිනාකම රු.41,475 ක් විය.

2.2.3 බදු කුලී

2014 ජනවාරි 01 දිනට හිඟ පොල බදු රු.213,617 ක් වූ අතර එකී හිඟ ශේෂයෙන් වර්ෂය තුල ලැබීම් රු.76,755 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට හිඟ පොල බදු ශේෂය රු.136,862 ක් විය. වර්ෂය තුල හිඟ අයවීමේ ප්‍රගතිය සියයට 35 ක් පමණ විය.

2.2.4 වීථි පහන් ආධාර

2014 ජනවාරි 01 දිනට ලැබිය යුතු වීථි පහන් ආධාර රු.178,596 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු.41,472 ක මුදලක් බිල්කර ඇති අතර, වර්ෂය තුල රු.1,800 ක් එම මුදලින් ලැබී ඇත. වර්ෂය තුල හිඟ මුදල් අය නොවී ඇති අතර, ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට වීථි පහන් ආධාර හිඟ මුදල රු.217,728 ක් විය.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 561,717 |
| (ආ) | මුද්දර ගාස්තු | 2,168,846 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

3.1.1 ණය පොලී ප්‍රතිපූර්ණය

2014 ජනවාරි 01 දිනට ප්‍රතිපූර්ණය කර නොගන්නා ලද දේපල ණය පොලී ශේෂය රු.178,596 ක් වූ අතර, 2014 දෙසැම්බර් 31 දිනට එකී ශේෂය රු.65,490 ක් විය.

3.1.2 සේවක ණය

සේවකයින් 9 දෙනෙකුට ලබාදී ඇති සේවක ණය සඳහා අදාල වාරික වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවී පවතින අතර 2014 දෙසැම්බර් 31 දිනට එකී ණය ශේෂය රු.29,603 ක් විය.

3.2 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | - | - |
| තෘතියික | 01 | 02 | - | 01 |
| ද්විතියික | 19 | 18 | 01 | - |
| ප්‍රාථමික | 30 | 25 | 05 | - |
| වෙනත් | - | 09 | - | 09 |
| | 51 | 55 | 06 | 10 |

පහත නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා රු.11,871,494 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල එකී වියදම රු.16,597,635 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.4,726,141 ක මුදලක් සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටවිය යුතු බව දක්වා තිබුණද පස්ගොඩ සභාව 2014 වර්ෂයේදී සේවකයින් 09 දෙනෙකු බඳවා ගෙන සභා අරමුදලින් වැටුප් වශයෙන් රු.2,597,829 ක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය
---------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) වියදම් පාලනය

(ඊ) ගබඩා පරිපාලනය

(උ) මානව සම්පත් කළමනාකරණය